පළාත් පාලන ආයතන මැතිවරණ දීර්ඝ කාලයකට නොපැවති උතුරු නැගෙනහිර පළාත්වල ජනයාට මෙම අවස්ථාව ලැබෙන්නේ දශක කිපයකට පසුවය. පළාත් පාලන ආයතනවල සේවාවන් සෙසු පළාත්වලටද වඩා අවශ්‍ය වන්නේද එම ප්‍රදේශවල ජනතාවටය. එහි ජනයාට, විශේෂයෙන් තරුණ තරුණියන්ට, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුල තම නියෝජිතයන් තෝරා ගැනීමට තමන්ට අයිතියක් ඇති බව ඒත්තු ගැන්වීමට මෙම මැතිවරණය මහඟු අවස්ථාවකි. එසේ සිදු වන්නේ නිදහස් හා සාධාරණ මැතිවරණ සාමකාමී තත්ව යටතේ පැවතුනහොත් පමණි.

හදිසි නීති තත්වය හා හදිසි නීති රෙගුලාසි ගණනාවක් තවමත් ක්‍රියාත්මක වන තත්ත්වයක් තුළ උතුරේ සමහර ප්‍රදේශවල රටේ සෙසු ප්‍රදේශවල නොමැති සීමා තවමත් පවතියි. අවම වශයෙන් මැතිවරණ සමයේ හෝ මෙම සීමා ඉවත් කිරීම අතිශයින් වැදගත් වේ.

පවතින මැතිවරණ නීතියේ හිඩැස්, කපොලු තුලින් රිංගා යමින් හෝ බොහෝ කාලයක සිට පුරුදු වී ඇබ්බැහින් බවට පත්ව ඇති දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා, මහජන දේපොල තම ජන්ද ව්‍යාපාරයන්ට යොදා ගැනීම ආදී පැවතුම් මෙම ජන්දයේදී අවම වේ යැයි අපගේ බලාපොරොත්තුවයි.

මැතිවරණ කොමසාරිස්තුමා හා ඔහුගේ දෙපාර්තමේන්තුවට, මැතිවරණ රාජකාරියේ නිරත වන ජන්ද නිලධාරීන් හා මැතිවරණ රාජකාරි සම්බන්ධ පොලිස් නිලධාරීන්ට තම රාජකාරිය අපක්ෂපාතව හා කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය උපරිම සහයෝගය, රාජ්‍ය හා දේශපාලන නායකයින් ලබා දෙන බවට භාවිතයෙන්ම පෙන්වීම රට සැබවින් ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට යොමු කරවීමේ අධිෂ්ඨානය ඔවුන් තුල ඇතැයි විශ්වාසය ඇති කරන ප්‍රබල සාධකයක් වනු ඇත.

රටේ නීතිය , මැතිවරණ නීතිය හා සාමය කඩකරන අපේක්ෂකයින් සම්බන්ධයෙන් පක්ෂ නායකයින් ගන්නා විනය පියවර ප්‍රකාශයට පත් කිරීම මහජනයා, විශේෂයෙන් තරුණ පරම්පරාව මැතිවරණ හා දේශපාලන පක්ෂ කෙරෙහි යහපත් ආකල්ප ඇති කර ගැනීමට පිටුවහලක් වනු ඇත.මෙම ප්‍රකාශ අනුව මොවුන් ක්‍රියාත්මක වේදැයි ජනතාව විමසිලිමත් විය යුතු වේ.තරඟවදින 20,000ට අධික අපේක්ෂකයන් අතරින් වැඩි සංඛ්‍යාවක් රටේ ප්‍රධාන පක්ෂ නියෝජනය කරයි. එබැවින් ඔවුන් සාමකාමී නීත්‍යනුකූල මැතිවරණ ව්‍යාපාර ඔස්සේ තරඟ වැදීම පක්ෂ නායකයින්ට අවශ්‍ය නම් සහතික කළ හැකි යයි අපගේ විශ්වාසයයි. නීති උල්ලංඝනය කරන සුළු පිරිසට නිසි විනය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවද නායකයන් සතුවේ.

විශේෂයෙන්ම ඉදිරි කාලය තුල පරිසර හිතකාමී මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයක් සඳහා තම අපේක්ෂකයන් යොමු කිරීම දේශපාලන පක්ෂවල මූලික වගකීමකි.

එබැවින් රට නව ප්‍රජාතන්ත්‍රවාදී, සාමකාමී මාවතක් ඔස්සේ සාමය කරා මෙහෙයවීම තමන්, තම පක්ෂය පළාත් පාලන ආයතනවල බලය කෙසේ හෝ දිනා ගැනීමට වඩා වැදගත් යැයි සලකන්නේදැයි මැන ගැනීමට ඉදිරි මැතිවරණය අවස්ථාවකි.

යුද්ධය අවසන් කළ අප රට සාමය, සාධාරණත්වය, නීතියේ ආධිපත්‍ය තහවුරු කරන ගමනක යෙදී සිටින බව නිගමනය කිරීමට ලෝකයා මෙම මැතිවරණය ද දර්ශකයක් කර ගනු ඇත. පෙර පැවති තත්ත්වය හා සසඳන විට හෝ කලාපයේ සෙසු රටවලට සාපේක්ෂව අපි නරක නැතැයි සිත සනසා ගැනීම ප්‍රමාණවත් නැත.

ස්තුතියි

මෙයට විශ්වාසී

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ